| 45. | එම | මෝටරයක කැඩී ගිය කොටස් | 01 |
| 46. | එම | බෝල් වැල් (කැඩී ඇත) | 03 |
| 47. | එම | වාහන කැසට් රෙකෝඩරය, (කැඩී ඇත) (සොනාසි වර්ගයේ) | 01 |
| 48. | එම | වැල්ඩින් ලාම්පු 01යි, හෝස් බට 02 | 01 |
| 49. | එම | කැසට් රේඩියෝ 01, ස්කුරුප්පු නියන් 01, කැඩීගිය තලයක් සහිත යකඩ ආයුධ 01, ගමන් මලු 01 | 01 |
| 50. | එම | මැටිපහන් 12 | - |
| 51. | එම | මෝටර් | 01 |
| 52. | එම | කඹ කැරලි | 01 |
| 53. | එම | පොරෝ | 01 |
| 54. | එම | පොරෝ | 01 |
| 55. | එම | පොරෝ | 01 |
| 56. | එම | කැඩී ගිය විදුලි පහන් (වාහනයක යැයි සිතිය හැකි) | 01 |
| 57. | එම | වීදුරු බෝතල් | 460 |
| 58. | එම | ප්ලාස්ටික් බෝතල් | 90 |
| 59. | එම | ප්ලාස්ටික් කෑන් | 39 |
| 60. | එම | තහඩු බැරල් | 01 |
| 61. | එම | ප්ලාස්ටික් කල | 04 |
| 62. | එම | කාලේ වීදුරු බෝතල් | 196 |
| 63. | එම | ප්ලාස්ටික් බාල්දි | 02 |

**කාර්යාලීය උපකරණ**

| | | |
|---|---|---|
| 64. | තැපැල් මුද්‍රා යන්ත්‍රය | 01 |
| 65. | හීටර් | 01 |
| 66. | භාවිතයෙන් ඉවත් කළ විදුලි පංකාව | 01 |

08-474

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා රේන්ද විකිණීම - 2015

ප්‍රා. ලේ./මීග/01/12/01/රා රේන්ද/2015.

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර 2014.09.23 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

2. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවේ අනුමත කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසිය පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2014.09.23 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය. විදේශ මත්පැන් රේන්දය සඳහා 2014.09.24 වැනි දින පෙ.ව. 10.30 ට පෙනී සිටිය යුතු ය.

5. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මා සතු වේ.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2014.11.13 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය. විදේශ මත්පැන් රේන්දය නැවත විකිණීම 2014.11.14 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ.

7. "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප.ව. 2.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාස තුනක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

8. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2014 ජූලි මස 24 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *තැබෑරුමේ අංකය සහ නම* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව සහ තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| අංක 10 - සෙත්තප්පාඩුව | මීගමුව | සෙත්තප්පාඩුව ගමේ පමණක් | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 5,000 | 2013.09.23 දින පෙ.ව. 10.30 දක්වා |
| අංක 11 - බසියවත්ත | මීගමුව | බසියවත්ත ගමේ පමණක් | එම | 5,000 | එම |
| අංක 12 - පිටිපන | මීගමුව | පිටිපන ගමේ පමණක් | එම | 5,000 | එම |
| අංක 15 - කුරණ | මීගමුව | කුරණ ගමේ පමණක් | එම | 5,000 | එම |
| අංක 16 - කාමච්චෝඩය | මීගමුව | කාමච්චෝඩය ගමේ පමණක් | එම | 5,000 | එම |
| අංක 17 - උඩයාර්තොප්පුව | මීගමුව | උඩයාර්තෝප්පුව ගමේ පමණක් | එම | 5,000 | එම |
| අංක 18 - කුඩා පාඩුව | මීගමුව | කුඩාපාඩුව ගමේ පමණක් | එම | 1,000 | එම |
| අංක 19 - දළුපත | මීගමුව | දළුපත ගමේ පමණක් | එම | 5,000 | එම |
| අංක 20 - පෝරුතොට | මීගමුව | පෝරුතොට ගමේ පමණක් | එම | 3,000 | එම |
| අංක 22 - පළඟතුරේ | මීගමුව | පළඟතුරේ ගමේ පමණක් | එම | 1,500 | එම |
| අංක 21 - කොච්චිකඩේ | මීගමුව | කොච්චිකඩේ ගමේ පමණක් | එම | 3,000 | එම |
| අංක 02 - ග්‍රීන් බාර් | මීගමුව | අංක 8 කොට්ඨාසයේ කුන්ඩන්විල පමණක් | එම එම | 3,000 | 2014.09.24 වැනි දින පෙ. ව. 10.30 දක්වා |

08-472

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ

2015 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතුන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ දෙවසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහලවකට (15%) නොඅඩු විය යුතු ය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත්කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල්පිටපත දිසාපතිවරයෙකු/ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහිතකය ඇමුණු ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර්පත ඇතුළත් කවරයේ උඩ වම් පස කෙළවරේ "අංක ........................... දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය - කොළඹ" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී කාර්යාලයට පැමිණ සිටිය යුතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

07. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ටෙන්ඩර්කරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල ආපසු දීම සහ ඉහත සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

08. 2014 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතුය.

09. ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද තොටුපල් රේන්ද විකිණීම යටතේ වූ රා රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

08. අනුමත කරන ලද කොන්දේසි හා රා තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

පහත සඳහන් රා තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන කොන්දේසි -

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 11.00 සහ ප. ව. 2.00 දක්වා හා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 සහ ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කල යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2014.09.12 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රා තැබෑරුම් විකුණන දිනය 2014.09.12 වැනි දින පෙ. ව. 10.45 වේ.

ඩී. පී. වික්‍රමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2014 ජූලි මස 31 වැනි දින,
කොළඹ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *(ඒ)* අනුක්‍රමික අංකය | *(බී)* ප්‍රදේශය | *(සී)* ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) |
|---|---|---|
| 1. | අංක 01 කොට්ඨාසය කොටහේන බටහිර (කොටබෝම්) | උතුරට : ශ්‍රීමත් රාමනාදන් මාවතේ මධ්‍ය රේඛාව හා ජෝර්ජ් ආර් ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය පිහිටි හෙට්ටිය වත්ත හන්දියේ සිට ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිරට ගියවිට ජම්පටා පටුමගේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>නැගෙනහිරට : ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ, මධ්‍ය රේඛාව හා ජම්පටා පටුමගේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ජම්පටා පටුමගේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගිය විට කේ. බී. ක්‍රිස්ටි පෙරේරා මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>දකුණට : ජම්පටා පටුමගේ මධ්‍ය රේඛාව හා ක්‍රිස්ටි පෙරේරා මාවත මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට කේ. බී. ක්‍රිස්ටි පෙරේරා මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ශාන්ත අන්තෝනි මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් රාමනාදන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය වන ශාන්ත අන්තෝනි පල්ලිය හන්දිය දක්වා ද,<br><br>බටහිරට : ශාන්ත අන්තෝනි මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් රාමනාදන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය වන ශාන්ත අන්තෝනි පල්ලිය හන්දියේ සිට ශ්‍රීමත් රාමනාදන් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ජෝර්ජ් ආර් ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය පිහිටි හෙට්ටියාවත්ත හන්දිය දක්වා ද වේ. |
| 02. | අංක 02 කොට්ඨාසය, කොටහේන බටහිර | උතුරට : ජෝර්ජ් ආර් ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව හා පිකරින්ස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට පිකරින්ස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට කොටහේන වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>නැගෙනහිරට : කොටහේන වීදියේ මධ්‍ය රේඛාව හා පිකරින්ස් පාරේ මධ්‍ය රේඛාව මුණ ගැසෙන මධ්‍ය ලක්ෂයේ සිට කොටහේන වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය වන ප්‍රධාන වටරවුම් හන්දිය දක්වා ද,<br><br>දකුණට : කොටහේන වීදියේ මධ්‍ය රේඛාව හා ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍ය වන ප්‍රධාන වටරවුම හන්දියේ සිට ජොර්ජ් ආර්. ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට පිකරින්ස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>බටහිරට : ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ මධ්‍ය රේඛාව හා පිකරින්ස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය ද වේ. |

| *(ඒ)* අනුක්‍රමික අංකය | *(බී)* ප්‍රදේශය | *(සී)* ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) |
|---|---|---|
| 03. | අංක 03 කොට්ඨාසය මෝදර (ස්කිනර් පාර) | *උතුරට :* පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හා ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ඩිලාසල් වීදියේ මධ්‍ය රේඛාව හා මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල හන්දිය පිහිටි ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව, මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට අලුත්මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන පොලීසිය හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද ,<br><br>*දකුණට :* මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හා අලුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන පොලීසිය හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට අලුත්මාවත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගිය විට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ.<br><br>*බටහිරට :* අලුත්මාවත පාරේ මධ්‍ය රේඛාව හා පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |
| 04. | අංක 04 කොට්ඨාසය මාදම්පිටිය (ෆර්ගියුෂන් පාර) | *උතුරට :* ජයන්ත මල්ලිමාරච්චි මාවතේ මධ්‍ය රේඛාව, මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හා ධවලසිංහාරාම මාවතේ මධ්‍ය රේඛාව හමුවන කොළඹ මහ නගර සභාවේ ඉන්ධන පිරවුම පිහිටි හන්දියේ මධ්‍ය ලක්ෂයේ සිට ධවලසිංහාරාම මාවතේ, මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට හේනමුල්ල පටුමගේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට හේනමුල්ල පටුමගේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ෆර්ගියුෂන් පාරේ මධ්‍ය රේඛාව හමුවන කැළණි නදී විහාර හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* හේනමුල්ල පටුමගේ මධ්‍ය රේඛාව හා ෆර්ගියුෂන් පාරේ මධ්‍ය රේඛාව හමුවන කැළණි නදී විහාර සන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට ෆර්ගියුෂන් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට ලූකස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*දකුණට :* ෆර්ගියුෂන් පාරේ මධ්‍ය රේඛාව හා ලූකස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලූකස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන තොටලඟ හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට :* ලූකස් පාරේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන තොටලඟ සන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට ජයන්ත මල්ලිමාරච්චි මාවතේ මධ්‍ය රේඛාව හා ධවලසිංහාරාම මාවතේ මධ්‍ය රේඛාව හමුවන කොළඹ මහ නගර සභාවේ ඉන්ධන පිරවුම පිහිටි හන්දියේ මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |
| 05. | අංක 05 කොට්ඨාසය මාදම්පිටිය | *උතුරට :* මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හා ලූකස් පාරේ මධ්‍ය රේඛාව හමුවන තොටලග හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට ලූකස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට හමුවන ෆර්ගියුෂන් පාරේ මධ්‍ය රේඛාව හරහා කැළණි ගඟේ වම් ඉවුර හමුවන ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* ලූකස් පාරේ මධ්‍ය රේඛාව ෆර්ගියුෂන් පාරේ මධ්‍ය රේඛාව හරහා ගියවිට කැළණි ගඟේ වම් ඉවුර හමුවන ලක්ෂයේ සිට කැළණි ගඟේ වම් ඉවුර ඔස්සේ දකුණු දිශාවට ගිය විට හමුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මායිම වන සෙබස්තියන් ඇළ ඔස්සේ දකුණු දිශාවට ගිය විට ජයන්ත මල්ලිමාරච්චි මාවතේ මධ්‍ය රේඛාව නාගලගම් වීදියේ මධ්‍ය රේඛාව හරහා සෙබස්තියන් ඇල දක්වා දික්කල විට හමුවන ලක්ෂය දක්වා ද,<br><br>*දකුණට :* ජයන්ත මල්ලිමාරච්චි මාවතේ මධ්‍ය රේඛාව නාගලගම් මාවතේ මධ්‍ය රේඛාව හමුවන හරහා සෙබස්තියන් ඇළ දක්වා දික්කල විට හමුවන ලක්ෂයේ සිට නාගලගම් වීදියේ මධ්‍ය රේඛාව හරහා ජයන්ත මල්ලිමාරච්චි මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව හමුවන ඔරලෝසු කණුව පිහිටි මහවත්ත හන්දියේ මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට :* සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව හා ජයන්ත මල්ලිමාරච්චි මාවතේ මධ්‍ය රේඛාව හමුවන ඔරලෝසු කණුව පිහිටි මහ වත්ත හන්දියේ මධ්‍ය ලක්ෂයේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හා ලූකස් පාරේ මධ්‍ය රේඛාව හමුවන තොටලඟ හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

12. *වැදගත් .-* 2014.09.12 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2014.11.03 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

08-593/1

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනය

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (3) වගන්ති ප්‍රකාර ට්‍රැවල් ආකේඩ් හොලිඩේ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් අංකය පී වී 72770 සහ ට්‍රැවල් ආකේඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් ඒකාබද්ධ වූ බව මෙයින් දන්වමු.

ඒකාබද්ධ වූ සමාගමේ නම : ට්‍රැවල් ආකේඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
දිනය : 2014 ජුනි 10

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-477

## ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නම : සිසුඔකා ජැපෑන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99900
සංස්ථාගත කළ දිනය : 2014.07.24
ලියාපදිංචි කාර්යාලය : අංක 1, ශ්‍රී ශ්‍රීලලංකාර මාවත, හබරකඩ, හෝමාගම

සමාගමේ ලේකම්.

08-493

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : බෙක්ටන් සිලෝන් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 91936
ලියාපදිංචි කළ දිනය : 2013.04.05
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 101/1 ඒ, මහබුත්ගමුව, මුල්ලේරියාව නව නගරය.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-499

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : සී ජී එස් ට්‍රේඩිං (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99278
ලියාපදිංචි කළ දිනය : 2014.06.24
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 191, මුහන්දිරම් පාර, කොළඹ 03.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-500

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : සී කේ ටී නේචර් ලයින් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 75500
ලියාපදිංචි කළ දිනය : 2010.11.15
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 593/2බී#1, නුවර පාර, බුළුගහ හංදිය, කැලණිය.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-501

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : අකුර අයිස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 92539
ලියාපදිංචි කළ දිනය : 2013.05.16
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 366, හියුජ් ප්‍රනාන්දු මාවත, නෙයිනමඩම, බටහිර නෙයිනමඩම.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-502

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : කුවුන් වුඩ් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 92685
ලියාපදිංචි කළ දිනය : 2013.05.23
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 33/1, හපුගහගෙදර, ලෝලුවාගොඩ, මීරිගම.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-503

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ලක්ෂරි ට්‍රැවල් ගෲප් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 92554
ලියාපදිංචි කළ දිනය : 2013.05.16
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 375, දෙවන මහල, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-504

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : මිකි ලංකා (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 93550
ලියාපදිංචි කළ දිනය : 2013.07.12
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 18/1/2/එච්. නුවර පාර, ඇල්දෙණිය, කඩවත.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-505

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : බන්දුල ඉන්ඩස්ට්‍රීස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 92627
ලියාපදිංචි කළ දිනය : 2013.05.21
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නිදහංගල, සොරබොර ජනපදය.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-506

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : වෙබ් එක්ස්ට්‍රීම්ස් සොලුෂන්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99524
ලියාපදිංචි කළ දිනය : 2014.07.07
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : හක්මන පාර, තිහගොඩ, මාතර, ශ්‍රී ලංකාව.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් ( පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

08-507

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරන නිවේදනය.

සමාගමේ නම : රසෝජා වෝටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98682
සංස්ථාගත කළ දිනය : 2014 මැයි මස 22 වැනි දින
ලියාපදිංචි ලිපිනය : මාඉඹුල පාර, වතුපිටිවල, නිට්ටඹුව.

සමාගම් ලේකම්.

08-517

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරන නිවේදනය

සමාගමේ නම : රිපබ්ලික් ග්ලෝබල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99391
සංස්ථාගත කළ දිනය : 2014 ජූලි මස 08 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 97, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, එඬේරමුල්ල, වත්තල.

සමාගම් ලේකම්.

08-518

---

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් පහත සඳහන් එකී දිනවල සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ටයිඩ්වෝටර් එස් ඩී සී (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපනය කළ දිනය : 2012.07.20
සමාගමේ අංකය : පීවී 87164
ලියාපදිංචි ලිපිනය : අංක 505/4 බී, ධර්මපාල මාවත, 4 වැනි පටුමග, තලවතුගොඩ.

සමාගමේ නම : ඕෆ්ෂෝ සර්වේයිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපනය කළ දිනය : 2009.07.30
සමාගමේ අංකය : පීවී 68631
ලියාපදිංචි ලිපිනය : අංක 505/4 බී, ධර්මපාල මාවත, 4 වැනි පටුමග, තලවතුගොඩ.

සමාගමේ නම : ඇක්සස්ලයින් එස් එල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපනය කළ දිනය : 2007.05.22
සමාගමේ අංකය : පීවී 60039
ලියාපදිංචි ලිපිනය : අංක 505/4 බී, ධර්මපාල මාවත, 4 වැනි පටුමග, තලවතුගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කේ. වී. එල්. ටී. ජයවර්ධන,
සමාගම් ලේකම්.

08-527/1

---

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව සස්ටේනබල් ඩිසයින් කන්සෙප්ට්ස් එස් එල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2010 අගෝස්තු මස 19 වැනි දින ලියාපදිංචි අංක පීවී 73858 යටතේ සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් සස්ටේනබල් ඩිසයින් කන්සෙප්ට්ස් එස් එල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම 2011 ජූලි මස 27 වැනි දින 8 වගන්තිය ප්‍රකාරව එහි නම "සස්ටේනබල් ඩිසයින් කොන්සෝටියම් (ප්‍රයිවට්) ලිමිටඩ්" යනුවෙන් වෙනස් කළ බවට ද කරනු ලබන නිවේදනයයි.

කලින් තිබූ නම : සස්ටේනබල් ඩිසයින් කන්සෙප්ට්ස් එස් එල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73858
ලියාපදිංචි ලිපිනය : අංක 505/4 බී, ධර්මපාල මාවත, 4 වැනි පටුමග, තලවතුගොඩ
නව නාමය : සස්ටේනබල් ඩිසයින් කොන්සෝටියම් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කේ. වී. එල්. ටී. ජයවර්ධන,
සමාගම් ලේකම්.

08-527/2

---

### සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ :

සමාගමේ නම : වෙස්ට්ආර්ට් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 12, පාර්ක්වේ, උද්‍යාන පාරෙන් ඔබ්බෙහි, කොළඹ 05
සමාගමේ අංකය : පී වී 99519
සංස්ථාගත කිරීමේ දිනය : 2014 ජූලි 7 වැනි දින

සීජ්එස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-528/1

---

### සමාගමක් සංස්ථාගත කිරීමක් පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නාමය : ඇඩප්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 5/4, හයිඩ් පාක්, රෙසිඩන්සීස්, 79, හයිඩ්පාක් කෝනර්, කොළඹ 02
ලියාපදිංචි අංකය : පී වී 99608
සංස්ථාගත කළ දිනය : 2014 ජූලි 09 වැනි දින

සීජ්එස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-528/2

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ අප විසින් පහත සමාගම සංස්ථාගත කළ බවට මෙයින් දන්වා සිටිමු :

සමාගම් නාමය : මෙට්‍රෝ ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 99756
සංස්ථාගත කළ දිනය : 2014.07.17
ලියාපදිංචි ලිපිනය : අංක 51/ඒ, දුම්රියපොල පාර, ගංගොඩවිල, නුගේගොඩ.

එම්. සී. මිහිඳුකුලසූරිය,
සමාගම් ලේකම්.

08-529

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

නාවල පාර, නාවල අංක 370, ඒ බී 1 ස්ථානයේ පිහිටි ආර් රිසෝට්ස් ඇන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, පීවී 99703 ලියාපදිංචි අංකය යටතේ 2014 ජූලි 15 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

අධ්‍යක්ෂක.

08-530

---

### දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : මනාකෝ ඩෙස්ටිනේෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 98588
සමාගමේ ලියාපදිංචි දිනය : 2014.05.13
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මීවැල්ල ගොඩනැගිල්ල, අංක 329, ගාලු පාර, කොළඹ 04.

ඒ. එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

08-533/1

---

### දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : මනාකෝ ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 98562
සමාගමේ ලියාපදිංචි දිනය : 2014.05.13
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මීවැල්ල ගොඩනැගිල්ල, අංක 329, ගාලු පාර, කොළඹ 04.

ඒ. එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

08-533/2

---

### දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : ලංකා සයොන්ගුඇන් මයිනින්ග් කො. (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 98333
සමාගමේ ලියාපදිංචි දිනය : 2014.04.28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 17, හේවා ඇවිනිව්, කොළඹ 07.

ඒ. එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

08-533/3

---

### දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : රෝයල් ඕකිඩ්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 98884
සමාගමේ ලියාපදිංචි දිනය : 2014.06.02
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14 ශ්‍රී ධර්මකීර්තියාරාම පාර, කොළඹ 03.

ඒ. එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

08-533/4

---

### දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : වෙන්චුරි හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 83673
සමාගමේ ලියාපදිංචි දිනය : 2012.01.12
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 122, හැව්ලොක් පාර, කොළඹ 05

ඒ. එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

08-533/5

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෑගල්ල, ඇදුරාපොත, පොල්ගහවෙල පාර, බී 33 /2 හි පදිංචි නැකැත්ගෙදරගේ නෙල්සන් ලක්සිරි ගුණසේන වන මා විසින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් පුෂ්පක ශ්‍රීලාල් දයානන්ද මහතා විසින් 2011.03.15 වැනි දින ලියා සහතික කළ අංක 255 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් නැකැත්ගෙදරගේ ඉන්දික නිශාන්ත ගුණසේන යන අයට පවරන ලද ඇටෝර්නි බලපත්‍රය, ඌව සබරගමුව කලාප රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 06 කාණ්ඩයේ 122 වන පත්‍රිුරුවේ දිනපොත් අංක 233 යටතේ 2011.04.01 වැනි දින ලියා පදිංචි කර ඇති අතර එකී ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2014 ජූනි මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

තවද, එකී ඇටෝර්නි බලකරුවන කෑගල්ල, ඇදුරාපොත, පොල්ගහවෙල පාර, බී 33/2 හි පදිංචි නැකැත්ගෙදරගේ ඉන්දික නිශාන්ත ගුණසේන යන අය විසින් මින් ඉදිරියට මගේ ඇටෝර්නි බලකරු වශයෙන් සිදු කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

නැකැත්ගෙදරගේ නෙල්සන් ලක්සිරි ගුණසේන

08-548

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය :

සමාගමේ නම : හන්තානා වැලි හොස්පිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90945
සංස්ථාගත කළ දිනය : 2014.02.08
ලිපිනය : 03 වැනි මහල, 285, ආර්.ඒ. ද. මැල් මාවත, කොළඹ 03.

සමාගම් ලේකම්.

08-549

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ දැනුම් දීමයි :

සමාගමෙහි නාමය : ආර්කිටයිප් ලංකා කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 98948
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2014 ජූනි 05 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-551

---

### 2007 අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කළ යුතු ගැසට් නිවේදනය

සමාගමේ නම : සීලන්ඩ් එක්ස්පෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපිත කළ දිනය : 2014.07.23
ලියාපදිංචි අංකය : පී වී 99874
ලියාපදිංචි කාර්යාලය : අංක 101/2, මාලපල්ල, පන්නිපිටිය.

ලේකම්.

08-570

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නම : කොටගල නර්සිං ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 99603
සමාගම සංස්ථාගත කළ දිනය : 2014.07.09
ලියාපදිංචි ලිපිනය : No. 25, Wootton Town, Kotagala
සමාගම් ලේකම් : මු. පුෂ්පරාජ්.

08-591

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව මම මෙසේ දැනුම් දී සිටිමි:

සමාගමේ නම : මෙඩිහෙල්ප් හොස්පිට්ල් පිළියන්දල (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි කාර්යාලය : අංක 172/3, පානදුර පාර, හොරණ
සමාගමේ අංකය : පී වී 99570
සමාගමක් කළ දිනය : 2014.07.08

චන්දික චතුරංග විජේසිරිවර්ධන,
කළමණාකාර අධ්‍යක්ෂ.

08-579

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ :

සමාගමේ නම : එස්. ටී. ඉන්ටර්නැෂනල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 99485
ලියාපදිංචි ලිපිනය : අංක 26 බී, මහානාම මාවත, වලාන, පානදුර

බී. ඒ. අයි. ප්‍රනාන්දු,
කළමනාකාර අධ්‍යක්ෂ.

2014 ජූලි 05 වැනි දින.

08-600

### මහජන දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ඔපුයුලෙන්ඩ් රිච් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 ජුනි මස 27 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔපුයුලෙන්ඩ් රිච් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 99 350
ලියාපදිංචි ලිපිනය : අංක 93/ඒ/3, පල්ලේමුල්ල පාර, අමුහේන්කන්ද, පරකඩුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/ 077 8 197 041

08-603

---

### මහජන දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව නෙත්මිත මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 ජුනි මස 19 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : නෙත්මිත මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 99 210
ලියාපදිංචි ලිපිනය : අංක 10, කුරුඳුප්පු පටුමග, ගොරකපල, පානදුර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/ 077 8 197 041

08-604

---

### ජේම්ස් ස්ටුවර්ට් (පීවීටී) එල්ටීඩී

පෙර ජේම්ස් ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සමාගමෙහි ලියාපදිංචි අංකය පී වී 6970**

*සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි*

පූර්ව ජේම්ස් ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2013 ඔක්තෝබර් මස 28 වැනිදා සිට බලපවත්වන පරිදි 2007 අංක 07 සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව, ජේම්ස් ස්ටුවර්ට් (පීවීටී) එල්ටීඩී යනුවෙන් වෙනස් කළ බව 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලබයි. සමාගමෙහි ලියාපදිංචි අංකය පී වී 6970 ලියාපදිංචි ලිපිනය "ස්ටුවර්ට් හවුස්" අංක 45, ජනාධිපති මාවත, කොළඹ 01.

ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්,
(සමාගම වෙනුවෙන් වූ සමාගම් ලේකම්වරු),
ස්ටුවර්ට් හවුස්.

අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01.

08-625

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ආකේ සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 99787
ලියාපදිංචි ලිපිනය : අංක 17/4, පරණ නාවල පාර, රාජගිරිය.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂක.

08-629

---

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ස්පාර්කල් සෝලා සිස්ටම්ස් (පී වී ටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 99665
ලියාපදිංචි ලිපිනය : අංක 801, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂක.

08-630

---

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : එස් ඒ ඩබ්ලිව් ලංකා හෝල්ඩිංස් (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පීවී 99432
ලියාපදිංචි ලිපිනය : අංක 68, පාම් ග්‍රෝව් ඇවනිව්, 3 වැනි පටුමග, රත්මලාන.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂක.

08-631

---

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : නේෂන් සීෆුඩ්ස් (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පීවී 98844
ලියාපදිංචි ලිපිනය : "නාමල්" අංක 1/7 එච්, බ්‍රවුන්ස් හිල්, මාතර.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂක.

08-632

**සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : සින්නලෝන් එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 99587
දිනය : 2014.07.09
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 57, වැලිකඩවත්ත පාර, රාජගිරිය.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 ජූලි මස 25 වැනි දින,
අංක 45, බ්‍රෙබෲක් වීදිය, කොළඹ 02

08-637

**සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ කරනු ලබන දැනුම්දීමයි

සමාගමේ නම : බ්ලූ මවුන්ටන් එපාට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99677
දිනය : 2014.07.14
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 86, කිරුළපන මාවත, කොළඹ 05

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 ජූලි මස 25 වැනි දින,
අංක 45, බ්‍රෙබෲක් වීදිය, කොළඹ 02.

08-638

**සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ කරනු ලබන දැනුම්දීමයි

සමාගමේ නම : ස්පයිස් ඇන්ඩ් හර්බ් කම්පැනි සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99597
දිනය : 2014.07.09
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 25 සී, ස්ටැෆර්ඩ් ඇවනියු, කොළඹ 06.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 ජූලි මස 22 වැනි දින,
අංක 45, බ්‍රෙබෲක් වීදිය, කොළඹ 02.

08-639

**සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ කරනු ලබන දැනුම්දීමයි

සමාගමේ නම : ඉමෙඩිකෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99159
දිනය : 2014.06.18
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 106, ලේක් පාර, බොරලැස්ගමුව.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 ජූලි මස 18 වැනි දින,
අංක 45, බ්‍රෙබෲක් වීදිය, කොළඹ 02.

08-640

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2015 වර්ෂය සඳහා රට බීම තැබෑරුම් රේන්ද විකිණීම

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශීක ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

* 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජාවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රටබීම තැබැරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,
* සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි

02. සෑම ටෙන්ඩර්පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින් ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතුන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් විම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තවද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත විම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ වසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ටෙන්ඩර් කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළවකට (15%) නොඅඩු විය යුතු ය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත්කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල්පිටපත දිසාපතිවරයෙකු/ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක් දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහිතකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ජේදයේ කරුණු අදාළ වේ.)

05. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් පස කෙළවරේ "2015 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "අංක ............................ දරන රට බීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය"යි යන්න සඳහන් ටෙන්ඩර් පත්‍ර 2014.09.15 වැනි දින පෙ. ව. 10.30 ට පෙර ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුයි.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

07. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

08. ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

09. 2014 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් රේන්දය පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම යටතේ වූ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

පහත සඳහන් රටබීම තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන කොන්දේසි :-

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා හා ප. ව. 2.00 සිට ප. ව. 8.00 දක්වා වේ.
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 සහ ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කල යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2014.09.15 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රට බීම තැබෑරුම් රේන්ද විකුණන දිනය 2014.09.15 වැනි දින පෙ. ව. 10.45 වේ.

**උපලේඛනය**

| *(ඒ)*<br>අනුක්‍රමික අංකය | *(බී)*<br>ප්‍රදේශය | *(සී)*<br>*ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
|---|---|---|
| 01. | අංක 01 කොට්ඨාසය කොටුව | *උතුරට :* ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට යෝර්ක් වීදියේ මධ්‍යරේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට පල්ලිය වීදියේ මධ්‍ය රේඛාව හා ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට නැගෙනහිර දිශාවට ගිය විට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා කෙලින් වීදියේ මධ්‍ය රේඛාව හමුවන බාන් ඔරලෝසු කණුව පිහිටි හන්දියේ මධ්‍ය ලක්ෂයේ සිට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට ඕල්කොට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*දකුණට :* දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හා ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට :* ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |
| 02. | අංක 2 කොට්ඨාසය මෝදර | *උතුරට :* පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හා ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට ඩිලාසල් වීදියේ මධ්‍ය රේඛාව හා මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල හන්දියේ පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මෝදර පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුණ කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*දකුණ :* මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුණ කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට අලුත් මාවත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට :* අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හා පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

12. *වැදගත්.-* 2014.09.15 වැනි දින විකිණීමට නොහැකි වූ රට බීම මත්පැන් තැබෑරුම් රේන්ද 2014.11.04 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඩී. පී. වික්‍රමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2014 ජූලි මස 31 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-593/2

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 73445913.

1. මද්දුමගේ දොන් විජේපාල මහතා,
2. මෙස්තියගේ දෝන දිලීපා දමයන්ති ගුණතිලක මිය,
3. මද්දුමගේ දොන් තුෂාර ධම්මික මද්දුම බණ්ඩාර මහතා,
4. මද්දුමගේ දෝන දුලානි කෝසලා මද්දුම බණ්ඩාර මිය යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.06.20 දිනැති අංක 1868 දරන ගැසට් පත්‍රයේ හා 2014 ජුනි 06 වැනි සිකුරාදා දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.08.30 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 703 මැලෑගම උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පානදුර තොටමුණේ, වාද්දුව වස්කඩු දෙබැද්දේ, මැලෑගම පිහිටි "මහවත්ත බොඩහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. බී. කේ. කොස්තා විසින් සාදන ලද 1981 නොවැම්බර් මස 03 දිනැති අංක 1501 දරන පිඹුරෙහි ලොට් 1 ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 1 ඒ උතුරටඃ කේ. දොන් අදිරියන් ජයතිලකගේ උරුමක්කරුවන්ට අයත් ඉද්දකැටිය කුඹුර ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 1 බී ද, දකුණට : වාද්දුව සිට මොරොන්තුඩුව දක්වා ප්‍රධාන පාර මෙම ඉඩමේ ලොට් 3 සහ මහවත්තෙහේන ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 3 සහ මහවත්තෙහේන ද, කේ. දොන් අදිරියන් ජයතිලකගේ උරුමක්කරුවන්ට අයත් ඉද්දකැටිය කුඹුර ද, වයඹට : කේ. දොන් අදිරියන් ජයතිලකගේ උරුමක්කරුවන්ට අයත් ඉද්දකැටිය කුඹුර ද මායිම්ව එකී අංක 1501 පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් විසිහතක (අ. 0 රූ. 3 පර්. 27) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 204/134 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. ඩී. එල්. පුෂ්පකුමාර මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
පානදුර අධිශ්‍රේණි ශාඛාව.

08-594

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කානගි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ගිණුම් අංක : 0016 1000 4888.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 මැයි 29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව තුන් කෝටි අසූ හතර ලක්ෂ අසූ දහස් එකසිය හතලිස් තුනයි ශත අනුවක (රු. 38,480,143.90) මුදල ද, 2014 මැයි 08 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි දෙලක්ෂ හත් දහසක (රු. 2,207,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%), රුපියල් දෙකෝටි අනූ ලක්ෂයක (රු. 29,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට

දහසයක් (16%), රුපියල් විසි එක් ලක්ෂ පනස් දහසක (රු. 2,150,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%), හා තවත් රුපියල් තිස් ලක්ෂ පනස් තුන් දහස් හයසිය අනූ අටයි ශත හැට හතරක (රු. 3,053,698.64) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.07.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2014.06.30 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.09.02 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. ආර්. එදිරිසිංහ යන අය විසින් සාදන ලද 2006 නොවැම්බර් මස 22 දාතම හා අක 2172 (වඩා නිවැරදිව 2172/ඒ) දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, පිඹුරු අංක 1507 හි ලොට් 5 සහ එම්. ගුණරත්න යන අයගේ ඉඩම සහ ලාල් යන අයගේ ඉඩම නැගෙනහිරට : එම්. ගුණරත්න, එස්. ඒ. යසරත්න සහ එස්. ඒ. පීටර් සිංඤෝ යන අයගේ, ඉඩම් දකුණට : එම්. ගුණරත්න සහ මායාදුන්න යන අයගේ ඉඩම් සහ බස්නාහිරට : 1507 දරන පිඹුරේ ලොට් 6 සහ 5 සහ එම්. ගුණරත්න යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි පර්චස් හයයි දශම නමයයි හතක් (අ. 1, රූ. 1, පර්. 6.97) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2272 දරන පිඹුරට අනුවය.

එකී පිඹුරු අංක 2172 හි නිරූපිත එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩම්වල ඒකාබද්ධයකි.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. ආර්. එදිරිසිංහ යන අය විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 30 දාතම හා අංක 1509 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම්, කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, එම්. ගුණරත්න යන අයගේ ඉඩම සහ ලාල් යන අයගේ ඉඩම නැගෙනහිරට : එස්. ඒ. යසරත්න සහ එස්. ඒ. පීටර් සිංඤෝ යන අයගේ ඉඩම්, දකුණට : එම්. ගුණරත්න සහ මායාදුන්න යන අයගේ ඉඩම් සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ එයට පිවිසුම් මාර්ගයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් අටයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 8.70) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1509 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 864/219 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. ආර්. එදිරිසිංහ යන අය විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 12 දාතම හා අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : එම්. ගුණරත්න යන අයගේ ඉඩම, දකුණට : ලෙට් 10 සහ 11 සහ බස්නාහිරට : ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 864/218 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරටඃ පාර නැගෙනහිරට : ලොට් 1 සහ 11, දකුණට : ලොට් 12 සහ බස්නාහිරටඃ ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 962/219 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ලොට් 2, දකුණට : ලොට් 12 සහ බස්නාහිරට : ලොට් 12 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ.0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 962/220 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ලොට් 12, දකුණට : ලොට් 12 සහ 7 සහ බස්නාහිරට : ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0 රූ. 0 පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 962/221 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 7 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 සහ 5, නැගෙනහිරට : ලොට් 12 සහ 8, දකුණට : මායාදුන්න යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 962/222 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 8 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 12, නැගෙනහිරට : ලොට් 9, දකුණට : මායාදුන්න යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ.0, රූ.0, පර්.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 962/223 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උඩුතුත්තිරිපිටිය පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 1507 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 9 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 12, නැගෙනහිරට : ලොට් 10, දකුණට : මායාදුන්න යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ලොට් 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1507 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 962/224 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 1507 හි නිරූපිත ලොට් 11 සහ 12 මතින් හා ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

පහත සඳහන් යන්ත්‍ර සූත්‍ර ද සමගය :

| | *Machine* | *Model* | *Serial No.* |
|---|---|---|---|
| 1. | Plastic Bottle Cap Molding Machine (HDPE) | SY 30BY (HDPE) | N/A |
| 2. | Plastic Bottle Cap Liner Machine | SD 280 A | N/A |
| 3. | Plastic Bottle Cap Liner Machine | SD 280A | N/A |
| 4. | Printing Machinc | SF-S8CA | 0803185 |
| 5. | Plastic Cap Cutter Machine | HG 28 | 0803185 |
| 6. | Plastic Cap Cutter Machine | HG 28 | 0803185 |
| 7. | Plastic Cap Cutter Machine | HG 28 | 0803185 |
| 8. | Plastic Cap Cutter Machine | HG 28 | 0803185 |
| 9. | Screw Air Compressors (Low Pressure) with Accessories | DY 2008-133-01 | 09-1263/TS 2231020 |
| 10. | Screw Air Compressors (High Pressure) with Accessories | 42W | 421103001 |
| 11. | PET Blow machine | EB-2-11 | 2007057 |
| 12. | PET Blow machine | EB-2-11 | 2006033 |
| 13. | PET Blow machine | EB-2-11 | 2011039 |
| 14. | Injection molding machine with Accessories – Perform Machine | HSJ-180K3 | 1001201 |
| 15. | Blow Molds | - | - |
| 16. | Plastic Crusher Machine | SG1635H | 3GL1101008 |
| 17. | Air Compressor | | |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

08-628/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. ජී. එස්. ධනසේන,
ගිණුම් අංක : 0168 5000 5000 සහ 1168 5404 3789.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 අප්‍රේල් 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූ නම ලක්ෂ හැත්තෑ තුන් දහස් එකසිය අසූවයි ශත අසූ හයක (රු. 9,973,180.86) මුදල ද, 2014 මාර්තු මස 16 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් තුන් ලක්ෂ අසූ නම දහස් පන්සිය හැට තුනයි ශත අසූ නමයක (රු. 5,389,563.89) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක (16%) හා තවත් රුපියල් දහ හතර ලක්ෂයක (රු. 1,400,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.07.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2014.06.30 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014 අගෝස්තු මස 29 (2014.08.29) වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරගම් කෝරළේ අංක 258 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නුවරගම් පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පොතෙනේගම (අක්කර 111 ) ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. බී. රත්නසිරි යන අය විසින් සාදන ලද 2012 ජනවාරි මස 08 දාතම හා අංක 5121 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 02 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රුවනි මංගලිකා දාබරේගේ ඉඩම (F. S. S. P. 55 හි 130 1/2 කොටසක්)

නැගෙනහිරට : අතිරික්ත වගාව, දකුණට : පාරක් සඳහා වෙන් කළ ඉඩම සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් 1 (අ. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් 0.1012 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග වෙළුම/පත්ඉරුව LDO D3/19 යටතේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

08-628/2

---

**කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී එල් සී - මහාවීදිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, පෑලියගොඩ නගර සභා සීමාවේ, පෑලියගොඩ පැලැන්වත්ත ස්වස්තික ගාඩින්ස් හි වරිපනම් අංක 20 සහ 22 දරන මල්වත්තමුල්ලේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ද සිල්වා විසින් 2009 ඔක්තෝබර් මස 22 වැනි දින සාදන ලද අංක 3784 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැක්වෙන පර්චස් තිහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 30.50)

විශාලත්වයෙන් යුත් ඉඩම ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග පහත සඳහන් මාර්ග ඔස්සේ ගමන් කිරීම ජලනළ එලීම සඳහා අගල් කැපීම මතුපිටින් සහ පොළොව යටින් විදුලි රැහැන් ඇදීම ආදිය සඳහා ඇති අයිතිය සමඟ වේ.

ලොට් ආර් 1 (අ. 0, රූ. 0, පර්. 1.75)
ලොට් ආර් 3 (අ. 0, රූ. 0, පර්. 10.19)
ලොට් ආර් 4 (අ. 0, රූ. 0, පර්. 7.56)

මිල්කි ටෙක්ස්ටයිල් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මොහොමඩ් සලීම් මොහොමඩ් ජෆාර් ණයකරු වශයෙන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2014ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.04.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2014.08.15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.08.18 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - අදාළ දේපළට නුවර පාර පෑලියගොඩින් පිවිසිය හැක. කොළඹ සිට නුවර පාරේ කැලණිය දෙසට ගමන් කරන විට හමුවන පෑලියගොඩ වටරවුම හංදිය පසුකර මීටර් 100ක් පමණ ගොස් වමට හැරුණු විට ස්වස්තික ගාඩින්ස් පිහිටා ඇත. එයට විරුද්ධ පැත්තේ කොවිලක් ඇත. එතැන් සිට මීටර් 75ක් පමණ ගමන් කළ විට ස්වස්තික ගාඩින්ස් හි වරිපනම් අංක 20 සහ 22 දරන අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතු ය,
08. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මහාවීදිය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ඒ. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,
අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 280, මහා වීදිය,
කොළඹ 11.
දුරකථන අංක : 011- 2380490 - 2
ෆැක්ස් අංකය : 011- 2380493.

08-557

## යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

*පළමුවන උපලේඛනය* .-

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ, මහගල්බොඩ, මෙගොඩ කෝරළයේ, බඩගමුව ගමේ පිහිටි දම්පිටිය වතුයාය වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් මැන සාදන ලද අංක 8786 සහ 2008.10.15 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 01 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද බිම් කොටස,

ප්‍රමාණය : අක්කර 0, රූඩ් 0, පර්. 36.

පර්චස් තිස් හයක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේත් සමග තවද, අංක 8786 දරන පිඹුරේ නිරූපිත කැබැලි අංක 2 මාර්ග අයිතියක් වශයෙන් පොදුවේ පරිහරණය කොට නඩත්තු කිරීමේ අයිතිය ද සමග,

*දෙවැනි උපලේඛනය*.-

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ, මහගල්බඩ මෙගොඩ කෝරළයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 725 දරන නාරම්පොළ ග්‍රාම සේවා වසමේ, කිරිවවුල ගමේ පිහිටි කිරිවවුල එස්ටේට් හෙවත් ඇවලෝන් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් මැන සාදන ලද අංක 9843 සහ 2012.02.13 දරන පිඹුර ප්‍රකාර බෙදාවෙන් කළ කැබලි අංක 02 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද බිම් කොටස.

ප්‍රමාණය : අක්. 0, රූඩ් 01, පර්. 31,

රූඩ් එකයි පර්චස් තිස් එකකුත් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියලු දේ ත් සමග,

තවද එකී පිඹුරේ නිරූපිත ප්‍රවේශ මාර්ගය පොදුවේ පරිහරණය කර නඩත්තු කිරීමේ මාර්ග අයිතිය ද සමග.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ මහගල්බඩ මෙගොඩ කෝරළයේ, කිරිවවුල ගමේ පිහිටි කිරිවවුල එස්ටේට් හෙවත් ඇවලෝන් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් මැන සාදන ලද අංක 9843 සහ 2012.02.13 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 03 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද බිම් කොටස.

ප්‍රමාණය : අක්. 0, රූ. 0, පර්. 28,

පර්චස් විසි අටක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේත් සමග,

තවද එකී පිඹුරේ නිරූපිත ප්‍රවේශ මාර්ගය පොදුවේ පරිහරණය කර නඩත්තු කිරීමේ මාර්ග අයිතිය ද සමග,

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සැන්ඩ්‍රා බෙවර්ලි වඳුරාගල විසින් සහතික කරන ලද අංක 17515 සහ 2012.03.31 වැනි දින දරන උකස් බැදුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය සමාගම් ලියාපදිංචි අංකය වන N (PVS) 27170 දරන සින්කා එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් බන්ධනදායී /උකස්කරු වශයෙන් කොළඹ 03, ගාළු පාරේ අංක 64 හි යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැදුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී සින්කා එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් හා සභාපති අධ්‍යක්ෂ වන ගලප්පත්ති පටබැඳිගේ පියදාස හෙවත් පියදාස ගලප්පත්ති යන අය විසින් පැහැර ඇති හෙයින්,

යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව 2014ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කුරුණෑගල නගරයේ සිට දඹුල්ල පාරේ කි. මී. 6ක් පමණ ගමන් කළ විට කිරිවවුල හමුවේ. එතැනින් දකුණට ගුරු පාරට හැරී තවත් මීටර් 125 පමණ ගිය විට අදාළ දේපළ පාරට මුහුණ ලා දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළයුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරික්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී. අංක 64, ගාළු පාර, කොළඹ 03.දුරකථන අංක 011-2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල, හල්ස්ඩෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 0773 - 181891.

08-598

## යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

### උපලේඛනය

කුරුණෑගල තෝරයාය, ඇවලෝන් වතුයායේ, අංක 171 දරන ස්ථානයේ පිහිටි කොහුබත් කම්හලේ දැනට සවිකොට ස්ථාපනය කොට ඇත්තාවූ ද සියලු යන්ත්‍රෝපකරණ තිරවුරු සවිකිරීම් හා උපාංග ද ඇතුළුව එකී යන්ත්‍රෝපකරණ සහ මෙවලම් සම්බන්ධ සියලුම යන්ත්‍ර සූත්‍ර උපකරණ උපාංග අනෙකුත් බඩු බාහිරාදිය සහ දේවල් ද සමගය.

*ඉහත කී ප්‍රකාශය :*

ඉහත දැක්වූ සින්කා එකස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම කොහුබත් කම්හලේ සවිකොට ස්ථාපනය කර ඇති පහත සඳහන් යන්ත්‍රෝපකරණ ය. එනම්,

1. අංක JF 02 - 62 - 4 TH 11640 දරන HP මෝටරය සහිත ග්‍රෝ බෑග් මැෂිම
2. අංක RV 03G -3-30MFG අංක 0510912 දරන 30 HP මෝටරය සහිත බහුකාර්ය ග්‍රෝ බෑග් මැෂිම
3. අංක JB/T9619 අංක 050504 දරන 30 HP මෝටරය සහිත බහුකාර්ය ග්‍රෝ බෑග් මැෂිම
4. අනුක්‍රමික අංක SBG -06-3C60 දරන බෙයිල් මැෂිම
5. කිරුම් තරාදිය.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සැන්ඩ්‍රා බෙවර්ලි වඳුරාගල විසින් සහතික කරන ලද අංක 17521 සහ 2012.04.03 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, සියලු යන්ත්‍රෝපකරණ තිරවුරු සවිකිරීම් හා උපාංග සමාගම් ලියාපදිංචි අංකය වන N(PVS) 27170 දරන සින්කා එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී/උකස්කරු වශයෙන් කොළඹ 03, ගාළු පාරේ, අංක 64 හි යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී සින්කා එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් පැහැර හැර ඇති හෙයින්,

යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව 2014ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 11.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කුරුණෑගල නගරයේ සිට දඹුල්ල පාරේ කි. මී. 6ක් පමණ ගමන් කළ විට කිරිවවුල හමුවේ. එතැනින් දකුණට ගුරු පාරට හැරී තවත් මීටර් 125 පමණ ගිය විට අදාළ දේපළ පාරට මුහුණ ලා දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළයුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී. අංක 64, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල, හල්ස්ඩෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 0773 - 181891.

08-599

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.